කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

මනෝවිද්‍යාව

ළමා මනෝවිද්‍යාව - **PSYC 28224**

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ළමා මනෝවිද්‍යාවේ ප්‍රධාන තේමාව ළමා සංවර්ධනය වේ." සුදුසු නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. පූර්ව ප්‍රසව අවධියේ යුක්තානුක හා කළල අවධිවල සංවර්ධනය සිදුවන ආකාරය අදාළ රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. පූර්ව ප්‍රසව සංවර්ධනයේ විෂමතා ඇතිවීමට බලපාන පහත දැක්වෙන ඕනෑම සාධක තුනක් (03) පහදන්න.

    අ. වර්ණදේහවල අසාමාන්‍යතා
    ආ. මාතෘ වයස
    ඇ. මත්පැන් සහ මත්ද්‍රව්‍ය
    ඈ. පරිසර දූෂණය
    ඉ. ලිංගිකව සම්ප්‍රේෂණයවන රෝග

04. ළදරුවියට (Infant period) අයත් ළමුන්ගේ කායික හා චාලක සංවර්ධනය ගෙනහැර දක්වන්න.

05. "මුල් ළමාවියේ දරුවෝ (පෙර පාසල් ළමුන්) සීමිත මට්ටමකින් චින්තනයේ යෙදෙති." ප්‍රජානන සංවර්ධනයේ පූර්ව ක්‍රියාකාරී අවධිය ඇසුරෙන් මෙම ප්‍රකාශය තහවුරු කරන්න.

06. "යූරි බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්ගේ පරිසර පද්ධති න්‍යාය ළමා සංවර්ධනයට බලපාන සංකීර්ණ පද්ධති තේරුම්ගැනීමට භාවිත කළහැකි රාමුවකි." පහදන්න.

07. නවයොවුන් වියේ පිරිමි ළමුන්ගේ සහ ගැහැණු ළමුන්ගේ කායික හා ප්‍රජානන වෙනස්කම් තුලනාත්මකව පරීක්ෂා කරන්න.

08. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකකට (02) සටහන් ලියන්න.

    අ. දරුවාගේ උපත් ක්‍රියාවලිය
    ආ. නවජයාගේ සංවේදන ඉන්ද්‍රියන්ගේ සංවර්ධනය
    ඇ. ස්කිමා
    ඈ. ඊඩිපස් හා ඉලෙක්ට්‍රා සංකීර්ණයන්

********************************